දෙවන වාර පරීක්ෂණය* 2018

මතුගම අධ්‍යාපන කලාපය

| නාට්‍ය හා රංග කලාව | 7 | කාලය පැය 02 යි |
|---|---|---|

නම -------------------------------------- පන්තිය ------

සැලකිය යුතුයි

- ❖ ප්‍රශ්න පත්‍රය i කොටස හා ii කොටස වශයෙන් කොටස් දෙකකින් යුක්තයි .
- ❖ i කොටසේ ප්‍රශ්න සියල්ලටම හා ii කොටසේ පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න දෙකකටද පිළිතුරු සපයිය යුතුයි.

---

1-5 දක්වා ප්‍රශ්න වල ඉදිරිපත් කර තිබෙන ප්‍රකාශය නිවැරදි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( × ) ලකුණද ඉදිරියේ දී තිබෙන වරහන තුළ යොදන්න

(1) අවස්ථා නිරූපණය රස වින්දනය සඳහා මෙන්ම ජීවිතාබෝධය සඳහාද උපකාර වේ (.........)

(2) හොඳ නාට්‍ය පෙළක් මගින් සාර්ථක නාට්‍යයක් බිහිකළ හැක (.........)

(3) ක්ෂණික නිරූපණයක් යනු පෙර සූදානමකින් තොරව පිටපතක් භාවිතයෙන් පුහුණුවකින් තොරව සිද්ධියක් හෝ අවස්ථාවක් රඟ දැක්වීමයි (.........)

(4) කතා ගොතා කීමෙන් පරිකල්පන ශක්තිය වර්ධනය වේ (.........)

(5) ඉතිහාස කතාවල නාට්‍යෝචිත අවස්ථා සොයා ගැනීමට නොහැක (.........)

විවිධ උච්චාරණ විධි පිළිබඳ ප්‍රයෝගික පරීක්ෂණයකින් පසු ගුරුවරයෙකු විසින් සිසුන් හට හිස්තැන් පිරවීම සඳහා දුන් ලිඛිත අභ්‍යාසයක් පහත දැක්වේ. දී ඇති වචන වලින් ගැලපෙන වචනය හිස්තැන් වලට යොදා වාක්‍ය අර්ථවත්ව සම්පූර්ණ කරන්න

( අනුකූලව, උච්චාරණය, කටහඬක්ෂ, චරිත, හඬක්ෂ )

(6) හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා ................................... ඉතා ප්‍රයෝජනවත් වේ

(7) හැඟීම් වලට ................................... හඬක්ෂ වෙනස් වේ

(8) ................................... එකම තලයක නොපිහිටුවා උච්චාණයේදී උස් පහත් කිරීම මගින් හඬක්ෂ හසුරුවා ගතයුතුය

(9) විවිධ හැඟීම් පළකිරීම සඳහා හඬ .................................. වෙනස් කර ගත යුතුය

(10) .................................. නිරූපණයේදී විවිධ අර්ථ ප්‍රකාශ කිරීම සඳහා කටහඬ හසුරුවමින් රංගනයේ යෙදිය යුතුය

නිවැරදි පිළිතුර තෝරන්න

(11) නම්පොත භාවිතා කිරීමෙන් අභ්‍යාස කළ හැකි වන්නේ

(1) හඬ අභ්‍යාසය (2) භාව නිරූපණ අභ්‍යාසය (3) රිත්මයානුකූල අභ්‍යාසය

(4) සංවේදන අභ්‍යාසය

(12) පරිසරයේ ඇසුන නාදයක් නැවත කර පෙන්වීම

(1) අනුකරණ ක්‍රියාවකි (2) ප්‍රතිනිර්මාණයකි

(3) පරිකල්පණයකි (4) අනුරූපණයකි

(13) ශරීරය සැහැල්ලු කර ගැනීම සඳහා සිදු කරන අභ්‍යාස හඳුන්වන්නේ

(1) ශරීරය උණුසුම් කිරීමේ අභ්‍යාස (2) ශිථිලකරණ අභ්‍යාස

(3) ස්වසන අභ්‍යාස (4) රිත්මයානුකූල අභ්‍යාස

(14) නාට්‍යයක සංවාද අයත් වන්නේ

(1) සාත්වික අභිනයටය (2) වාචික අභිනයටය

(3) ආංගික අභිනයටය (4) ආහාර්ය අභිනයටය

(15) සෝමා දේවී කතා පුවත

(1) ජනකතාවකි (2) ඓතිහාසික කතා පුවතකි

(3) ප්‍රබන්ධ කතාවකි (4) උපමා කතාවකි

16 - 20 දක්වා ප්‍රශ්න වලට දී ඇති අදහසට ගැලපෙන නිවැරදි පදය / උත්තරය වාක්‍ය ඉදිරියේ තිත් ඉර මත ලියන්න

(16) ඕනෑම රංගයක් ඉදිරිපත් කිරීම සඳහා භාවිතා වන ස්ථානය .................................

(17) නාට්‍යයේ කතා වස්තුවෙන් කියවෙන දෙය .................................

(18) අසා , කියවා, හෝ රඟ දැක්වීමෙන් රස විදිය හැකි මාධ්‍ය .................................

(19) චිත්‍ර සටහන් කැමරාවක් මඟින් රූගත කර ඉදිරිපත් කරන මාධ්‍ය .................................

(20) නාට්‍ය ප්‍රචාරය සඳහා යොදා ගත හැකි විද්‍යුත් මාධ්‍යයකි .................................

(ලකුණු 20×1 =20 )

ii කොටස

සැලකිය යුතුයි

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 2 කට පිළිතුරු සපයන්න.

1 වැඩ ඇති විට අතපසු නොකරන් නේ
අද දවසට වැඩ අද කරපන් නේ
හෙට දවසට හෝ කල් නොදමන් නේ

..................................................................

(1) මෙම කවියේ ඉතිරි පදය සම්පූර්ණ කරන්න (ලකුණු 02)
(2) මෙම කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථය නම් කරන්න (ලකුණු 02)
(3) එය රචනා කරන ලද්දේ කවුද? (ලකුණු 02)
(4) මෙය රචනා කර තිබෙන්නේ කුමක් අරමුණු කර ගෙනද? (ලකුණු 02)
(5) මේ කවියෙන් උපදේශාත්මක වැකියක් සාදා ලියන්න (ලකුණු 02)



1

2 (1) ඉහත රූප සටහනින් දැක්වෙන රංග භූමිය නම් කරන්න (ලකුණු 02)
(2) නූතන රංග භූමිය මනක්කල්පිතව බෙදා දක්වන ලද බෙදීම් සංඛ්‍යාව කීයද? (ලකුණු 03)
(3) රංග භූමියක මූලික ලක්ෂණ දෙකක් දක්වා විස්තර කරන්න (ලකුණු 05)

3 (1) විද්‍යුත් ශ්‍රව්‍ය දෘෂ්‍ය මාධ්‍යයක් නම් කරන්න (ලකුණු 02)

(2) ටෙලි නාට්‍යයක හා වේදිකා නාට්‍යයක් අතර වෙනස්කම් තුනක් දක්වන්න (ලකුණු 03)

(3) වේදිකා නාට්‍යයක හා ටෙලි නාට්‍ය අතර පවතින සමානකම් කරුණු දෙකක් යටතේ විස්තර කරන්න (ලකුණු 05)

4 (1) ඓතිහාසික කතාවක් හා සම්බන්ධ වීර චරිත දෙකක් නම් කරන්න (ලකුණු 02)

(2) එම චරිත වීරත්වයෙන් සැලකීමට හේතු වූ පධාන කරුණු සදහන් කරන්න (ලකුණු 03)

(3) ඔබ දක්වන ලද එක් වීර චරිතයක් සම්බන්ධ ඓතිහාසික කතාවක

අවස්ථාවක් පිළිබඳ සංවාදයක් ගොඩ නගන්න (ලකුණු 05)

5 (1) ශිථිලකරණය යන්න කෙටියෙන් හඳුන්වන්න (ලකුණු 02)

(2) ශිථිලකරණ අභ්‍යාසයක් සිදුකරන ආකාරය විස්තර කරන්න (ලකුණු 03)

(3) ශිථිලකරණය අභ්‍යාස මගින් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියා විස්තර කරන්න (ලකුණු 05)

(3x10=30)